www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂය: ඉන්දියානු ධනේශ්වර පාලනයේ ප්‍රධාන මුක්කුවක්

## Communist Party of India (Marxist): a key prop of Indian bourgeois rule

දීපාල් ජයසේකර සහ අරුන් කුමාර් විසිනි
2009 මැයි 20

මාසයක් තිස්සේ අදියර පහකින් පැවැති ඉන්දියානු මහ මැතිවරනයට දින දෙකකට පෙරාතුව, අපි ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඑම්) මධ්‍යම කාරක සභික ඒ.කේ. පද්මනාභන් සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමු.

ඔහු සීපීඑම් හා වාම පෙරමුනේ වාර්තාව සහ ඉදිරිදර්ශනය ද එය නායකත්වය දෙන බහු-පක්ෂ මැතිවරන සන්ධානය ද නිර්ලජ්ජී ලෙස ආරක්ෂා කලේය. වසර හතරක් තිස්සේ සීපීඑම් කොංග්‍රස් පක්ෂයේ නායකත්වයෙන් යුක්ත එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ (යූපීඒ) ආන්ඩුවට මුක්කු ගැසීම, විකල්ප “අනාගමික” හා “ජනතා-හිතැති” ආන්ඩුවක පදනම ලෙස දක්ෂිනාංශික ප්‍රාදේශීය හා කුල-පාදක පක්ෂවලින් සමන්විත “තුන් වන පෙරමුනක්” ප්‍රවර්ධනය කිරීමේ එහි වත්මන් ප්‍රයත්නයන්, බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව විසින් අනුයනු ලබන ආයෝජන-හිතැති” කාර්මිකකරන” පිලිවෙත සහ මහා අවපාතයෙන් පසුව මේ දක්වා පැවති ධනවාදයේ දැවැන්තම අර්බුදයේ කොන්දේසි යටතේ සමාජවාදය ඓතිහාසික න්‍යාය පත්‍රයේ නොමැති බවට, සීපීඑම් ජ්‍යෙෂ්ඨ රාජ්‍යතාන්ත්‍රික ජෝති බාසුගේ වචන යොදා ගත හොත් සමාජවාදය” ඈත අනාගතයට අයිති” බවට එය කරන අවධාරනය එම වාර්තාවට ඇතුලත්ය. (සම්මුඛ සාකච්ඡාවේ වාර්තාව සඳහා බලන්න: ඉන්දියානු ස්ටැලින්වාදී නායකයෝ කොංග්‍රසය සහ දක්ෂිනාංශික ප්‍රාන්තීය පක්ෂ සමග සන්ධානයන් ආරක්ෂා කරති)

“විප්ලවවාදී” චාරිත්‍ර වාරිත්‍රවල -- රතු ධජ, දෑකැති හා මිටි, මාක්ස්ගේ, ලෙනින්ගේ හා චේ ගුවේරාගේ ආලේඛ්‍ය -- පුහු ආටෝපවලට පිටුපසින් සීපීඑම් ක්‍රියාත්මක වන්නේ, ඉන්දියාව විදේශ ආයෝජන සඳහා ආකර්ෂනීය භූමියක් සහ ලෝක ධනවාදය සඳහා ලාභ ශ්‍රම නිෂ්පාදකයකු බවට පත් කිරීමේ ඉන්දියානු ධනේශ්වරයේ ප්‍රයත්නයට කම්කරු පන්තිය සහ ඉන්දියානු පීඩිත ජනයා දක්වන විරුද්ධත්වය අපසරනය කිරීමට හා පීලිපැන්නවීමට ක්‍රියාකරන, ඉන්දියානු ධනේශ්වර දේශපාලන සංස්ථාපිතයට ඒකාග්‍රිත පක්ෂයක් ලෙසය.

සීපීඑම් වෙනුවෙන් කතා කරමින්, පද්මනාභන් කියාපාන්නේ “වසර 20ක් තිස්සේ අපි ලිබරලීකරන පිලිවෙත්වලට, ඊනියා ගෝලීයකරන පිලිවෙත්වලට විරුද්ධව සටන් කරන්” බවයි. මෙය පචයකි. ඔවුන්ගේ පාර්ලිමේන්තුවේ ඡන්ද බලය යොදාගනිමින්, සීපීඑම් සහ වාම පෙරමුන, පුද්ගලීකරනය, නියාමනහරනය, මහ ව්‍යාපාරිකයන් සඳහා බදු සහන, කෘෂිකාර්මික මිල සහයෝගය කප්පාදු කිරීම සහ සෙසු ආයෝජන-හිතැති පිලිවෙත් සහිත ඉන්දියානු ධනේශ්වරයේ” නව ආර්ථික පිලිවෙත” ආරම්භ කල නරසිම්හ රාඕගේ සුලුතර කොංග්‍රස් ආන්ඩුව (1991-96) බලයේ තබා ගැනීමට උදව් කලේය. 1996-98 එක්සත් පෙරමුනු ආන්ඩුව සහ කොංග්‍රස් පක්ෂයේ නායකත්වයෙන් යුක්ත යූපීඒ ආන්ඩුව බලයේ තබා ගැනීම සහ ඇත්ත වසයෙන් ම ඒවායේ පිලිවෙත් සූත්‍රගත කිරීම සම්බන්ධයෙන් ස්ටැලින්වාදියෝ වඩා ඍජු ක්‍රියාකලාපයක් ඉටු කලහ. මෙම ආන්ඩු දෙකම නව-ලිබරල්වාදී ප්‍රතිසංස්කරන ඉදිරියට තල්ලු කලහ.

ඔවුන් බලයේ සිට ඇති ප්‍රාන්ත වන බටහිර බෙංගාලය, කේරලය සහ ත්‍රිපුර තුල, සීපීඑම් සහ එහි වාම පෙරමුනු සගයෝ ධනේශ්වරයේ ප්‍රතිව්‍යුහගතකරන වැඩපිලිවෙල ඍජුව ම ක්‍රියාවට දමා ඇත. දේශීය හා විදේශීය ආයෝජකයන් ආකර්ෂනය කරගනු වස්, බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව, තොරතුරු තාක්ෂන හා තොරතුරු තාක්ෂනය යොදාගන්නා කර්මාන්ත තුල වර්ජන තහනම් කොට, බදු සහන ලබා දී, සමාජ වියදම් කප්පාදු කොට, විශේෂ ආර්ථික කලාප සඳහා ඉඩම් පවරාගැනීමේ සිය වැඩපිලිවෙලට එරෙහි ගොවියන්ගේ විරුද්ධත්වය මැඩීම පිනිස පොලිස් සහ මැර ප්‍රචන්ඩත්වය යොදා ගෙන ඇත.

මෙම දක්ෂිනාංශික පිලිවෙත්, හින්දු ස්වෝත්තමවාදී බීජේපීයේ හිටපු සගයා සහ ප්‍රති-කොමියුනිස්ට්වාදී වාචාලයකු වන මමතා බැනර්ජීට සහ ඇගේ ත්‍රිනමූල් කොංග්‍රසයට, තරමක් සාර්ථකව, දුප්පතුන්ගේ ආරක්ෂකයා ලෙස පෙනී සිටිය හැකි කොන්දේසි නිර්මානය කර තිබේ.

සීපීඑම්, ආර්ථිකයේ සමහර අංශ ජාත්‍යන්තර ප්‍රාග්ධනයට විවෘත කිරීම ද ලාභදායක රාජ්‍ය අංශයේ ආයතන මහා පරිමානයෙන් පුද්ගලීකරනය ද මන්දගාමී කිරීමට හෝ වලකාලීමට උත්සාහ කර තිබේ. එහෙත් ඔවුන් එසේ කරන්නේ, ධනවාදයට එරෙහිව කම්කරු පන්තියේ නායකත්වයෙන් යුක්ත මහජන ව්‍යාපාරයක් වර්ධනය කිරීමේ දෘෂ්ටි ආස්ථානයෙන් නොව, ඉන්දියානු ප්‍රාග්ධනයේ වඩා දුර්වල කොටස් ආරක්ෂා කිරීම ද විදේශ ප්‍රාග්ධනයේ පීඩනයට හා බලයට මුහුන දීම පිනිස ඉන්දියානු ධනේශ්වර රාජ්‍යය අත යම් පාලනයක් තබා ගැනීම සහතික කරගැනීම ද සඳහා ය.

එලෙස ම, "ස්වාධීන විදේශ පිලිවෙතක්" සඳහා ස්ටැලින්වාදීන් කරන කෑඳවුමට, අධිරාජ්‍යවාදයට එරෙහිව ජාත්‍යන්තර කම්කරු පන්තිය බලමුලුගැන්වීම මත පදනම් වූ සැබෑ අධිරාජ්‍ය-විරෝධී පිලිවෙතක් සමග මොනම සම්බන්ධතාවක් වත් නැත. එක්සත් ජනපදයට උවමනාවට වඩා සමීපව බැඳුන හොත් ධනේශ්වර ඉන්දියාවට ස්වකීය අවශ්‍යතා තහවුරු කරගැනීමට බාධා වෙතැයි තර්ක කරමින්, සීපීඑම්, ඉන්දියානු ධනේශ්වරය සඳහා, "බහු-පාර්ශ්වීයත්වය", එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ චීනය හා රුසියාව සමග වඩා සමීප සබඳතා මත පදනම් වූ විකල්ප විදේශ පිලිවෙතක් ප්‍රවර්ධනය කරයි.

හින්දු අධිපතිවාදී බීජේපිය බලයට ඒමට විරුද්ධ වීම පිනිස පවත්නා එකම ක්‍රමය එය ය යන පදනම මත, සීපීඑම්, යූපීඒ ඇතුලු, නව දිල්ලියේ දක්ෂිනාංශික ආන්ඩු මාලාවකට ම තමන් දුන් සහයෝගය යුක්තියුක්ත කර තිබේ.

එහෙත් 1980 ගනන්වලින් ඇරඹී ඉන්දියානු දේශපාලනය තුල ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉෂ්ඨ කරන්නන් ලෙස බීජේපිය සහ කුල-පාදක පක්ෂ ගනනාවක් ම මතුවීම ම, කම්කරු පන්තිය සටන්කාමී වෘත්තීය සමිති අරගලවල පටු රාමුව තුල සිරකරමින්, කම්කරු පන්තිය ඒ හෝ මේ ධනේශ්වර පක්ෂයට යටත් කිරීමේ ස්ටැලින්වාදීන්ගේ දශක ගනනාවක් දීර්ඝ පිලිවෙතෙහි ප්‍රතිඵලයකි.

1960 ගනන් හා 1970 ගනන්වල දී, වැඩෙන ලෝක ධනේශ්වර අර්බුදයක කොන්දේසි යටතේ, ඉන්දියාව කම්කරු හා ගොවි අරගල මාලාවකින් සොලවාලනු ලැබීය. කෙසේවෙතත්, ස්ටැලින්වාදීන් අවධාරනය කලේ, සියවස් කාර්තුවක ස්වාධීන පාලනයක් තුල දී, ඉඩම්හිමි බලය හා කුලවාදය තුරන්කර දැමීම ඇතුලු, ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ මූලික කර්තව්‍යයන් විසඳලීමට ඇති සිය ඓන්ද්‍රීය නොහැකියාව ඔප්පු කර තිබූ, ඉන්දියානු ධනේශ්වරයට කම්කරු පන්තියෙන් වැඩෙන අභියෝගයක් එල්ලවීමේ කිසිඳු අපේක්ෂාවක් තබා ගත නොහැකි බවයි. ස්ටැලින්වාදී අවධි දෙකේ විප්ලව න්‍යාය -- එහි සීපීඑම් ප්‍රභේදය හඳුන්වන්නේ මහජන ප්‍රජාතන්ත්‍ර විප්ලවය නමිනි -- අනුව යමින්, ස්ටැලින්වාදීන් තර්ක කලේ, ඉන්දියාවේ ජාතික ධනේශ්වර වර්ධනය ශක්තිමත් කිරීමෙහිලා ධනේශ්වරයේ ප්‍රගතිශීලී හා අධිරාජ්‍ය-විරෝධී යයි කියනු ලබන කන්ඩායමට කම්කරු පන්තිය සහයෝගය දිය යුතු බවයි. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයට (සීපීඅයි) මෙම කන්ඩායම කොංග්‍රස් පක්ෂය සහ ඉන්දිරා ගාන්ධි විය. 1964 දී සීපීඅයි වෙතින් භේද වූ සීපීඑම් සඳහා එය ජනතා පක්ෂය විය. බීජේපීයේ පෙරප්‍රාප්තිකයා වූ ජන සංග් මෙම ජනතා පක්ෂයේ ප්‍රධාන කොටසක් විය. මහජන නැගිටීම් මගින් ස්ටැලින්වාදීන් බලයට තල්ලු කෙරුනු සෑම තන්හිම, පද්මනාභන් ම පිලිගන්නා පරිදි, ඔවුහු ධනපති පාලනය පවත්වාගෙන යමින්, පවත්නා නෛතික-ව්‍යවස්ථාමය රාමුව තුල පක්ෂපාතීව වැඩ කලහ.

අවසානයේ දී, මර්දනයේ (ඉන්දිරා ගාන්ධිගේ හදිසි නීතිය) සහ සහන දීමේ (බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව විසින් ක්‍රියාවට දමන ලද ඉඩම් ප්‍රතිසංස්කරන වැනි) සංයෝජනයක් මගින්, ධනේශ්වරය මහජන නැගිටීම යටපත් කර දමා සිය පාලනය ස්ථාවර කරගැනීමට සමත් විය. මහජනතාවගේ මූලික ගැටලු විසඳලීමට ධනේශ්වරයේ පශ්චාත්-ස්වාධීන ජාතික සංවර්ධන මූලෝපාය (ඊනියා කොංග්‍රස් සමාජවාදය) ප්‍රදර්ශනය කල අසමත්කම හමුවේ ස්වකීය විසඳුම ඉදිරිපත් කිරීමෙන් කම්කරු පන්තිය ස්ටැලින්වාදීන් විසින් වලකනු ලැබ තිබූ හෙයින්, විවිධාකාර දක්ෂිනාංශික කුලවාදී හා වර්ගෝත්තමවාදී පක්ෂ, මහජන දරිද්‍රතාව, වැඩෙන සමාජ අසමානතාව හා කුල පීඩනය පිලිබඳව වැඩෙන මහජන වෛරය හා අසහනය තම වාසිය පිනිස යොදා ගැනීමට හා අපසරනය කිරීමට සමත් විය.

බීජේපියේ නැගීම, සමාජ අර්බුදයේ ගැඹුරුතරභාවයේ ද ඉන්දියානු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ -- අධිරාජ්‍ය-විරෝධී අරගලය ගබ්සා කිරීමෙන් හා දකුනු ආසියාව වාර්ගිකව බෙදා වෙන් කිරීමෙන් උපන් ප්‍රජාතන්ත්‍රවාදයක් -- විකෘත ස්වභාවයේ ද එබැවින් කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන බලමුලුගැන්වීමේ හදිසි භාවයේ ද දර්ශකයකි.

එහෙත් ස්ටැලින්වාදීන්ට නම්, බීජේපියේ නැගීම, තව දුරටත් දකුනට පැද ඉන්දියානු සංස්ථාපිතයේ දේශපාලනය තුලට තවත් ගැඹුරට ඒකාග්‍ර වී ගැනීම පිනිස කඩතුරාවක් ලෙස සේවය කර තිබේ.

යූපීඒ සිට තුන් වන පෙරමුන දක්වා

පන්ති අරගලය යටගැසීමේ ස්ටැලින්වාදීන්ගේ ක්‍රියාකලාපය, පසුගිය පස් වසර තුල ඔවුන්ගේ ක්‍රියාවන් මගින් නිදර්ශනීය කෙරේ.

නිල දේශපාලනයේ විකෘත ප්‍රිස්මය හරහා වුවත්, 2004 මැතිවරනය පෙන්නුම් කලේ, ඉන්දියානු ධනේශ්වරයේ සමාජ-ආර්ථික න්‍යාය පත්‍රයට පැවති පුලුල් මහජන විරුද්ධත්වයයි. “ප්‍රතිසංස්කරන, එහෙත් මහජන මුහුනුවරක් සහිතව” යන සිය කැඳවුම මත පදනම්ව, කොංග්‍රසය ප්‍රථම ස්ථානයට ඔසවා තැබුනු අතර, වාම පෙරමුන, බොහෝ සෙයින් කොංග්‍රසයට එරෙහිව ආසන දිනාගනිමින්, එහෙත් පැවති සිය හොඳම මැතිවරන ජයග්‍රහනය වාර්තා කලේය.

මහ ව්‍යාපාරිකයන්ගේ ආඥාවන් ක්‍රියාත්මක කිරීමට කොංග්‍රසයට පත්වනා අභිප්‍රාය අවධාරනය කරනු වස්, සෝනියා ගාන්ධි, 1990 ගනන් මුල දී මුදල් ඇමති ලෙස “ප්‍රතිසංස්කරන” ක්‍රියාවට දැමීමට මූලිකත්වය ගෙන තිබූ මන්මෝහන් සිං අගමැති ලෙස වහාම නම් කලාය. ඒ අතරතුර, සීපීඑම්, කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත ආන්ඩුවක් සඳහා තෙවන පාර්ශ්වීය සහයෝගය රැලි කිරීමෙහිලා මූලිකත්වය ගෙන එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ අවම පොදු වැඩපිලිවෙල කෙටුම්පත් කිරීමට සහභාගි විය. එය වනාහි, ඉන්දියාව ලෝක ධනේශ්වර නිෂ්පාදනය සඳහා ලාභ ශ්‍රම පාරාදීසයක් බවට පත් කිරීමේ ධනේශ්වරයේ ගාමකය සහ ඉන්දියානු වැඩ කරන ජනතාවගේ අභිලාෂයන් හා අවශ්‍යතා එකිනෙක පෑහිය හැකිය යන පවය මත පදනම් වූ ලියවිල්ලකි.

පෙරදැකිය හැකි වූ පරිදි ම, මාස කිහිපයක් තුල දීම, තමන් පාර්ලිමේන්තුව තුල පිටුබලය සපයන යූපීඒ ආන්ඩුව, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග මූලෝපායික හවුල්කාරිත්වයක් ඇති කරගැනීම ඇතුලු. පෙර පැවති බීජේපී නායකත්වයෙන් යුක්ත ආන්ඩුවේ පිලිවෙත්වලට බෙහෙවින් සමාන පිලිවෙත් අනුයන බව පිලිගැනීමට ස්ටැලින්වාදීන්ට බල කෙරුනි.

සීපීඑම් “නියම වේලාවට කොංග්‍රසයෙන් හා යූපීඒ ආන්ඩුවෙන් හේද වූ” බව පද්මනාභන් කියාපායි. තථ්‍ය වසයෙන් ගත් කල, වාම පෙරමුන සිද්ධිදායකව ආන්ඩුවෙන් ඉවතට තල්ලු කර දැමුවේ කොංග්‍රසයයි.

යූපීඒ තමන් එක්සත් ජනපදය සමග සාකච්ඡා කර එකඟවී තිබූ සිවිල් න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට නොදමන්නේ ය යන තනි කොන්දේසිය මත එයට වසර පහක මුලු පාලන කාලය සඳහා ම සහයෝගය ලබාදෙන බවට සහතික වෙමින්, සීපීඑම් ඉන්දියාවට ස්ථාවර ආන්ඩුවක් සැපයීමට නැවතනැවතත් පොරොන්දු විය. කොංග්‍රසය වසරකට වැඩි කාලයක් තිස්සේ, න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට දැමීමට ආසන්න මට්ටමට ගෙන ආ විවිධ පියවරවලට ස්ටැලින්වාදීන්ගේ එකඟතාව ලබාගනිමින්, උපාමාරුවල යෙදුනු අතර, එය තෝරාගැනීමේ අවස්ථාවක් පැමිනි කල කෙලින්ම කාරනාව මතු කලේය.

තම සගයා දශකයක් හෝ ඊටත් වැඩි කාලයක් තිස්සේ ඉන්දියානු ධනේශ්වරයේ තීරනාත්මක අරමුනක්ව පැවති ඉන්දු-එක්සත් ජනපද “මූලෝපායික” සන්ධානය තහවුරු කරගැනීමත් සමග කොංග්‍රසය සමග පැවති සිය හවුල්කාරිත්වය අවසන්ව ඇති තතු යටතේ, ස්ටැලින්වාදියෝ, තවත් ප්‍රතිගාමී, බංකොලොත් පාර්ලිමේන්තු උපාමාරුවකට පැනගැනීමට ඉක්මන් වූහ. ඔවුහු විවිධාකාර ප්‍රාන්ත-පාදක හා කුල-පාදක පක්ෂවලින් සමන්විත “බීජේපී විරෝධී, කොංග්‍රස්-විරෝධී” තුන් වන පෙරමුනක් අටවාගෙන එය “අනාගමික, මහජන-හිතැති ආන්ඩුවක්” සඳහා පදනම සම්පාදනය කිරීමට සමත් වෙතැයි කියාපෑහ. එම පක්ෂ සියල්ලම බීජේපීයේ හා කොංග්‍රසයේ හිටපු සගයන් වන අතර ඔවුන් සියල්ලටම දීර්ඝ දක්ෂිනාංශික වාර්තා පවතී.

ස්ටැලින්වාදීන්ගේ තුන් වන පෙරමුනු සගයන්ගේ ප්‍රතිගාමී වාර්තා ප්‍රතික්ෂේප කිරීමට පද්මනාභන් අසමත්ය. ඒඅයිඒඩීඑම්කේ නායිකා ජයලලිතා 2003 වසරේ ආන්ඩුවේ සේවකයන්ගේ වර්ජනයක් බිඳිනු පිනිස පොලිස් ප්‍රචන්ඩත්වය, වර්ජන බිඳින්නන් හා මහා පරිමාන දොට්ට දැමීම් යොදාගැනීම පිලිබඳව තමිල්නාඩුවේ කම්කරුවන්ගේ සාධාරන වෛරයට ලක්ව තිබේ. ටීඩීපී නායක චන්ද්‍රබාබු නායිදු ලෝක බැංකුවේ ප්‍රචාරක ඒජන්තයෙක් විය. එහෙත් පද්මනාභන් තර්ක කරන්නේ, ජයලලිතා හා නායිදු තම අත්දැකීම්වලින් “ඉගෙනගෙන” ඇති බවට සහ තමන් කොංග්‍රසයේ හා බීජේපීයේ පිලිවෙත්වලට විරුද්ධ බවට ඔවුන් කියාපාන විට ඔවුන්ගේ වචනය විශ්වාසයට ගත යුතු බවට ය. මෙහි මාක්ස්වාදී පන්ති විශ්ලේෂනයක ඇඟවුමක් වත් නැත. පද්මනාභන් “ප්‍රජාතන්ත්‍රවාදී බලවේග” ලෙස හඳුන්වන්නේ තථ්‍ය වසයෙන් ම ඉන්දියානු ධනේශ්වරයේ විවිධාකාර ප්‍රාදේශීය කන්ඩායම්වල අවශ්‍යතා ප්‍රවර්ධනය කරන සහ මහජන සහයෝගය රැලි කරගනු වස් ජනවාර්ගික-භාෂාමය හා කුල අනන්‍යතා තම වාසියට යොදා ගන්නා ධනේශ්වර පක්ෂ ය.

තුන් වන පෙරමුන දේශපාලන ගර්භාවක් හා තමන්ට මූලික වාසිය ලෙස පෙනෙන මාවත අනුව යන ප්‍රාදේශීය ධනේශ්වර පක්ෂවලින් සමන්විත තාවකාලිකව අටවා ගැනුනු කන්ඩායමකි. එය මොන යම් හෝ ප්‍රකාශයක් හෝ කිසිදු ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නිකුත් කිරීමට අසමත් වූ අතර මැතිවරනය හමාර වීමටත් පෙරාතුව පවා එම පෙරමුනේ සාමාජික පක්ෂවලින් බොහොමයක් කොංග්‍රසය හා/හෝ බීජේපීය සමග රහස් කේවල් කිරීම්වල යෙදුනේ ය.

සීපීඑම් සහ වාම පෙරමුන සම්බන්ධයෙන් ගත හොත්, ඔවුහු ද ඉන්දියානු ධනේශ්වරයේ සම්ප්‍රදායික ආන්ඩු

පක්ෂය වන කොංග්‍රසය සමග උපාමාරු දැමීමට සූදානම් වෙමින් සිටියහ. තුන් වන පෙරමුනේ ආන්ඩුවක් පිලිබඳ සමස්ත සැලැස්ම ම කියාපානු ලැබුවේ මැතිවරනයේ ප්‍රතිඵලයක් ලෙස කොංග්‍රස් පක්ෂය දුර්වල වනු ඇති අතර එවිට බීජේපී නායකත්වයෙන් යුක්ත එන්ඩීඒ යලි බලයට ඒමට ඉඩ දෙනවා වෙනුවට විවිධාකාර ප්‍රාදේශීය පක්ෂ සහ ස්ටැලින්වාදීන් විසින් තනනු ලබන ආන්ඩුවකට " පිටතින් " සහයෝගය දීම සිය අවශ්‍යතා සමග ගැලපෙනු ඇතැයි කොංග්‍රසය තීන්දු කරතැයි යන්න මතය. එමෙන්ම බීජේපීය වලකාලීමේ නාමයෙන් කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත ආන්ඩුවකට සිය සහයෝගය දීම පිලිබඳ කාරනාව මුලුමනින්ම බැහැර නොකිරීමට ද සීපීඑම් හා සීපීඅයි නායකයෝ ප්‍රවේශම් වූහ. වාම පෙරමුන කොංග්‍රසයට පාර්ලිමේන්තු පිටුබලය සැපයීම බැහැර කරන්නේ දැයි විමසූ කල, සීපීඑම් දේශපාලන මන්ඩල සාමාජික සීතාරාම් යෙචුරි ප්‍රකාශ කලේ, " කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත ආන්ඩුවකට සහයෝගය දීමේ අවශ්‍යතාව පැන නගිනු ඇතැයි අප සිතන්නේ නැහැ " යන්නයි.

කේරලයේ දී හා බටහිර බෙංගාලයේ දී මෙන් තමන්ම ක්‍රියාකාරී ලෙස ධනේශ්වර වැඩපිලිවෙල ක්‍රියාවට දැමීමට අවස්ථාව නොලැබෙන කල්හි, සීපීඑම් හා එහි වාම පෙරමුන ඉන්දියානු ධනේශ්වරයේ පක්ෂ පිලිබඳ මිථ්‍යාවන් ක්‍රමානුකූලව ප්‍රවර්ධනය කිරීමටත් කම්කරු පන්තියේ ප්‍රතිරෝධය කඩාකප්පල් කිරීමට හා මැඩීමටත් ක්‍රියා කරති.

ට්‍රොට්ස්කිවාදයේ විප්ලවවාදී උරුමය දෙසට හැරී නොනවතින විප්ලවයේ මූලෝපාය මත පදනම්ව ඉන්දියානු කම්කරු පන්තියේ නව විප්ලවවාදී සමාජවාදී පක්ෂයක් ගොඩනැගීමේ අරගලය ආරම්භ කිරීමට, ඉන්දියාවේ සමාජවාදී හිතැති කම්කරුවන්ට, ශිෂ්‍යයන්ට හා බුද්ධිමතුන්ට කාලය එලඹී දැන් බොහෝ කල් ගත වී ඇත. ඉන්දියාවේ සංවර්ධනය අඩාල කිරීමට අඛන්ඩව හේතු වන ඉඩම්හිමි බලය, කුලවාදය සහ වැඩවසම් පසුගාමිත්වයේ හා අධිරාජ්‍යවාදී පීඩනයේ සමස්ත උරුමය ම තුරන් කර දැමීමට නම්, කම්කරු පන්තිය ධනේශ්වර පාලනයට විප්ලවවාදී ලෙස විරුද්ධව ද ලොව වටා කම්කරුවන්ගේ සමාජවාදී අරගලයේ කොටසක් ලෙස ද පීඩිත ජනයාට නායකත්වය දිය යුතුය.

© www.wsws.org